**<u>ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලියේ දී ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.</u>**

## 1. ඉතිහාසය සහ සන්දර්භය

වර්ෂ 2014 දී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත්කරන ලද පරිදි ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 10% ක ප්‍රතිශතයකට කිසියම් ආකාරයක ආබාධ සහිත තත්වයක් පවතියි. මේ අතර යුද්ධය නිසා ආබාධ සහිත තත්ත්වයන්ට පත්වූ තැනැත්තන්, මාර්ග අනතුරු වැනි විවිධ අසාධ්‍ය තත්ත්වයන් හේතුවෙන් ආබාධ සහිත තත්වයට පත්වූ තැනැත්තන් සහ බෝනොවන දියවැඩියාව වැනි රෝග තත්ත්වයන් නිසා ආබාධ සහිත තත්ත්වයට පත්වූ තැනැත්තන් සැළකිල්ලට ගැනේ.

එමෙන් ම, ශ්‍රී ලංකාව වනාහී ඉක්මනින් වයස්ගත වන ජනගහනයක් වෙසෙන රටකි. සමස්ත ජනගහනයෙන් 22% ක ප්‍රතිශතයක්, එනම් සෑම මිනිසුන් පස්දෙනෙකුගෙන් එක් අයෙකුම වර්ෂ 2030 වන විට 60 වන විය පසුකල පුද්ගලයෙකු වීමට අවකාශ පවතින බව අනාවරණය වී තිබේ.මේ අනුව වයස්ගතවීම නිසා ආබාධ සහිත තත්ත්වයන්ට ලක්වන්නන්ගේ සංඛ්‍යාව ද සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතියි.

සෙසු පුරවැසියන් විසින් නියත වශයෙන්ම හිමිකම් ලෙස සළකනු ලබන මූලික අයිතිවාසිකම් වන සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමේ හිමිකම, අධ්‍යාපනය ලැබීමේ හිමිකම, රැකියාවක නිරතවීමේ හිමිකම වැනි අයිතීන් අවුරා තිබීම හා සමාජයෙන් කොන්කර දැමීම, අන්‍යයන්ගෙන් යැපෙන මට්ටමකට පත්කිරීම මෙන්ම සම අවස්ථා ලබාගැනීමේ නිදහස සීමාකිරීම යන තත්වයන්ට දීර්ඝ කාලයක් තිස්සේ බඳුන් වීමට ආබාධ සහිත පුද්ගලයන්ට සිදුව තිබේ.

තවද, ආබාධ සහිත පුද්ගලයන් ඓතිහාසික වශයෙන් දේශපාලන තීරණගැනීමේ ක්‍රියාවලි තුළදී ද කොන්වීමට ලක්ව ඇති අතර මේ වනවිට එවැනි ක්‍රියාවලීන් සඳහා සහභාගී වීමට සහ එවැනි ක්‍රියාදාමයන් වලදී තම අනන්‍යතාවය නියෝජනය කිරීමට ඔවුනට මහත් අභියෝග රාශියක් පවතී.

දැනට ක්‍රියාත්මක වන ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය උදෙසා ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතීන් ද ඇතුළත්ව මානව හිමිකම් වෙනුවෙන් පෙනීසිටින ක්‍රියාකාරීන් හට පහත දක්වා ඇති කරුණු වලින් සමන්විතව, ප්‍රථම වරට නිර්මාණය වන නව ව්‍යවස්ථාවක් සඳහා සිය දායකත්වය දැක්වීමට ලැබී ඇත්තේ මහඟු අවස්ථාවකි.

- සෑම ආකාරයකින් ම ආබාධ සහිත පුද්ගලයින් භේද රහිතව අන්තර්ග්‍රහණය කොටගෙන සැකසුනු ව්‍යවස්ථාවක් වීම.
- සෙසු ජනකොටස් මෙන්ම සම අයිතිවාසිකම් භුක්ති විඳින ජනකොටසක් ලෙස ආබාධ සහිත පුද්ගලයින් ඍජුව හඳුනාගනිමින්, සෑම ක්ෂේත්‍රයක ම ඔවුනට විශේෂ අවධානය යොමුවන පරිද්දෙන් ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ නව පනතක් සම්මත කිරීම මගින් ඒ බව සහතික කිරීම.
- එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ප්‍රකාශයට පත්කොට තිබෙන ආබාධ සහිත ජනතාව සතු අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අපරානුමත කිරීම හරහා බැඳී සිටින පොරොන්දු ප්‍රකාර,ඊට අදාළ විධිවිධාන ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව ව්‍යවස්ථාව තුළ සම්පාදනය කිරීම.

## 2. ඉහත අවශ්‍යතා සපුරාලීම සඳහා යෝජිත ක්‍රියා පටිපාටිය

මෙකී පූර්ණ අන්තර්ග්‍රහණ ඉලක්කයට අනුකූලව, ජනවාර්ගික හා ආගමික සුළුතරයන් පමණක් නොව, සෙසු සියලු සුළුතර ජනකොටස් ද ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියේ පාර්ශවකරුවන් ලෙස උපයෝගී කරගැනීමට රජය ක්‍රියාකළයුතුය.

මේ අනුව, ආබාධ සහිත පුද්ගලයින් ද තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සක්‍රීය දායකත්වය දැක්වීමට සහ ඒ පිළිබඳ අදහස් විමසීමේ ක්‍රියාදාමයන්ට දායකවීමට අයිතිවාසිකම් හිමි ජනකොටසක් ලෙස සැළකිල්ලට බඳුන් විය යුතුය.

ජනතාව රාජ්‍ය තන්ත්‍රයේ අත්තනෝමතික බලපෑම්වලින් ආරක්ෂා කිරීමත්, එම බලපෑම් වලට මුහුණදීම සඳහා සවිබල ගැන්වීමත්, ජනමතය පිළිබිඹු කිරීමත් යන කාර්යයන් ව්‍යවස්ථාවකින් ඉටුවීමට අපේක්ෂිතය. මෙම කාර්යය සිදුවන බව සපථ කිරීමට නම්, ඵලදායී මහජන සහභාගීත්වයක් තිබීම අත්‍යවශ්‍ය වේ.

එබැවින්, ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ මහජන මත විමසන කමිටුව විසින් ආබාධ සහිත පුද්ගලයන් වෙතත්, ඔවුන් නියෝජනය කරන සංවිධාන වෙතත්, ආබාධ සහිත තත්ත්වයන් ඇති තැනැත්තන් වෙනුවෙන් පෙනී සිටින ක්‍රියාකාරිකයන් වෙතත් යොමුවී ඔවුන්ගේ අදහස් ලබාගත යුතුය.

ඒ අනුව, විශේෂයෙන් කොළඹින් පරිබාහිර දිස්ත්‍රික්කවල සිදුවන මහජන අදහස් ලබාගැනීමේ සැසිවල දී සිවිල් සමාජයේ වෙසෙන ආබාධ සහිත ජනතාව සඳහා අවස්ථාව ලබාදිය යුතු අතර ඔවුනට එවැනි අවස්ථාවලදී මුහුණදීමට සිදුවන භෞතික සහ ආකල්පමය බාධක මගහරවාලීමට ද කටයුතු කළ යුතුය.

- ව්‍යවස්ථා කෙටුම්පතෙහි පිටපත් ආබාධ සහිත ජනතාවට පහසුවෙන් පරිශීලනය කොට ග්‍රහණය කළ හැකි වන ආකාර වලින් (බ්‍රේල් මාධ්‍යයෙන්, විශාලිත මුද්‍රණ මාධ්‍යයෙන්, සංඥා භාෂාවෙන්, දෘෂ්‍ය මාධ්‍ය වලින් සහ පහසුවෙන් වටහා ගත හැකි සරළ ආකාරවලින්) සකසා ආබාධ සහිත ජනතාව සඳහා වූ සංවිධාන සහ ආබාධ සහිත ජනතාව වෙනුවෙන් කටයුතු කරන හා ඔවුන් වෙනුවෙන් පෙනීසිටින සෙසු සිවිල් සංවිධාන අතර බෙදාහැරිය යුතුය.
- මහජන මත විමසුම් පැවැත්වීමේ දී ආබාධ සහිත ජනතාවට පහසුවෙන් පිවිසිය හැකි ස්ථාන වල ඒවා පැවැත්විය යුතු අතර අවශ්‍ය අවස්ථාවල දී සංඥා භාෂා පරිවර්තකයින්ගේ සහය ද ලබාගතයුතුය.
- නුදුරේ දී මැතිවරණ කොමිෂන් සභාව මගින් සිදුකල ආකාරයට අදාළ ජනමත විමසුම් අවස්ථාවන්හී තම අදහස් දැක්වීමට පැමිණෙන ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවාහන වියදම් ඇතුළු වෙනත් විවිධ පහසුකම් සහ අනුමැතීන් ලබාදීමට කටයුතු කළ යුතුය.
- ව්‍යවස්ථා සංශෝධනය සඳහා ජනමතය විමසන සමස්ත ක්‍රියාවලිය සඳහා ම මීට වඩා වැඩි කාලයක් ලබා දිය යුතුය.

## 3. ව්‍යවස්ථා සංශෝධනය සඳහා ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතීන් සුරැකීම වෙනුවෙන් සැළකිල්ලට ගැනීමට යෝජිත මූලධර්ම.

පහත සඳහන් අන්තර් සම්බන්ධිත මූලධර්ම සියල්ල මත නව ව්‍යවස්ථාවේ සියලු විධිවිධාන පදනම් වීම වැදගත් බව මෙයින් නිර්දේශ කෙරෙන අතර විශේෂයෙන් ම අයිතිවාසිකම් පිළිබඳව අන්තර්ගත පනතෙහි ඒවා ප්‍රමුඛ කොට දැක්වීමත් ආබාධ සහිත ජනතාවගේ හිමිකම් හා අයිතිවාසිකම් වෙනුවෙන් එහි වෙනම කොටසක් සැකසීමත් යෝජිතය.

| තේමාව අනුව වර්ගීකරණය | සාධාරණීකරණ හේතු පාඨය | යෝජිත භාෂා භාවිතය |
| --- | --- | --- |
| ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය | මෙම සර්වත්‍රික මූලධර්මය රාජ්‍ය බලය මගින් ව්‍යවස්ථාපිත විධිවිධාන ඉක්මවීම හේතුවෙන් ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් අරභයා අතීතයේ සිදු වූ හෝ අනාගතයේ සිදුවිය හැකි උල්ලංඝනය වීමේ අවස්ථා වලින් ඔවුන් ආරක්ෂා කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. මෙමගින් ආබාධ සහිත පුද්ගලයින්ට ව්‍යවස්ථා විරෝධී නීතීන් සහ ක්‍රියාකාරකම් හමුවේ අධිකරණයේ සහය පැතීමටත් අධිකරණමය ක්‍රියාමාර්ග මගින් එවැනි අවස්ථා පිළිබඳ යළි සළකා බැලීමට අවකාශය සලසා ගැනීමටත් හැකිය. | ව්‍යවස්ථාව උත්තරීතර වන අතර එහි සඳහන් නීති රාමුව සමඟ නොගැළපෙන නීති සියල්ල බල රහිත වේ. |
| මූලිකඅයිතිවාසිකම් | ආබාධ සහිත පුද්ගලයන්ගේ ආර්ථික සහ සාමාජීය පසුබිමට සම්බන්ධ අයිතිවාසිකම් අවියෝජනීයව බැඳී ඇත්තේ ඔවුන්ගේ දේශපාලන | මෙම අයිතිවාසිකම් පනත මගින් සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ අවියෝජනීය අයිතිවාසිකම් පිළිගන්නා අතර අපගේ සමස්ත සිවිල්, දේශපාලනික, ආර්ථික, සාමාජීය හා සංස්කෘතික මානව හිමිකම් වල ඓයින්ද්‍රියත්වය සහ අන්තර් |

| | | |
|---|---|---|
| | අයිතිවාසිකම් භුක්ති විඳීමේ හැකියාව වේ. එබැවින් ව්‍යවස්ථාව මගින් ආබාධ සහිත ජනතාවගේ ආර්ථික සාමාජීය සංස්කෘතික සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් තහවුරු විය යුතු අතර එම අයිතිවාසිකම් නව පනතක් මඟින් ස්ථාපිත කළ යුතුය. | සහයෝගීත්වය හඳුනාගෙන තහවුරු කෙරේ. |
| මූලිකඅයිතිවාසිකම් | වෙනස් කොට නොසැළකීම පිළිබඳ වගන්තිය මඟින් ශාරීරික සහ මානසික ආබාධ සහිත තත්ත්වයන් ඇති පුද්ගලයින් පිළිබඳ අඩු දැනුමක් සහ අධ්‍යයනයක් ඇති බව සැළකිල්ලට ලක් කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ  අදාළ පනතේ ඇතුළත් කිරීමේ දී මානසික ආබාධ සහිත පුද්ගලයින්ට අදාළ රැකවරණය පිළිබඳ විශේෂ කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු අතර එවැනි මානසික ආබාධ සහිත පුද්ගලයින්ගේ ආබාධ සහිත තත්ත්වය ඉතා විවෘතව දැන හඳුනා ගත නොහැකි බව අවබෝධ කර ගනිමින් කටයුතු කළ යුතුය.<br>සමානත්වයෙන් සැළකිමේ සහ වෙනස්කම් වලට ලක් නොකිරීමේ අයිතිවාසිකම් පිළිබඳ වූ වගන්තිය මගින් සම අවස්ථා ලබා දීම යතෝක්ත කරුණ සඳහා සම්බන්ධ නීතිමය ආවශ්‍යතාවක් ලෙස සැළකිය යුතු අතර එය ව්‍යවස්ථාවෙහි මෙය හා සම්බන්ධ නොවන කොටස් සඳහා පමණක් සීමා කිරීමෙන් වැළකිය යුතුය.<br>ආබාධිත සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරන ලද මූලික ජාත්‍යන්තර සම්මුතින්ගේ ඇතුළත් අයිතිවාසිකම් වලින් වෙනස් වීමේ හෝ ඒවාට අමතරව හිමිකම් හා අයිතිවාසිකම් එකතු වීමේ අවශ්‍යතාවයක් නොමැත. නමුත් එම අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීමේ දී ආබාධ සහිත පුද්ගලයින් සඳහා සම අවකාශයක් හිමි වන පරිසරයක් තුළ විවිධ වෙනස්කම් සහ අනුවර්තනයන් උපයෝගී කර ගනිමින් අදාළ තත්ත්වයන් ඇති කිරීම සඳහා රජයට යුතුකමක් ඇති | නීතිය ඉදිරියේ සෑම දෙනාම සමතැන්හි ලා සැළකිය යුතු අතර නීතියේ සුරක්ෂිතභාවය හා සම අවස්ථා සෑම දෙනාටම හිමි විය යුතුය. කිසිදු පුද්ගලයෙක් ස්වකීය ජන වර්ගය, ආගම, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික අනන්‍යයතාවය, විවාහකභාවය, මාතෘත්වය,වයස, භාෂාව හෝ මානසික/ ශාරීරික ආබාධ තත්ත්වය යන කාරණා මත පදනම්ව වෙනස්කම් වලට ලක් නොකළ යුතුය.<br>රජය විසින් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ පූර්ණ සමානාත්මතාවය ඇති කිරීමට පියවර ගත යුතු අතර මෙහිදී ආබාධ සහිත ගැහැණු ළමුන් සහ කාන්තාවන් ලක්වන බහුවිධ වෙනස්කම් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුය.<br>ඊට අදාළ විධිවිධානයන් වෙනස්කොට සැළකීමක් ලෙස ව්‍යවස්ථාවේ කිසිදු වගන්තියක අර්ථ දැක්වීමෙන් වැළකිය යුතුය. |

| | | |
|---|---|---|
| | අතර එවැනි තත්ත්වයන්හි දී ආබාධ සහිත පුද්ගලයින් හට සැබැවින්ම ඔවුන් සඳහා වූ හිමිකම් භුක්ති විඳීම සඳහා අවකාශ සැළසිය යුතුය.<br>එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත් කරන ලද අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මඟින් සිදුකෙරෙන්නේ දැනට පවතින මානව අයිතිවාසිකම් ආබාධ සහිත පුද්ගලයන් විසින් මුහුණ දෙන තත්ත්වයන් යටතේ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ඉඩකඩ සැලසීමයි. එය සිදුවන්නේ සම අවස්ථා පිළිබඳ මූලධර්මය මත පදනම් වෙමිනි. අන්‍යයන් සමඟ සම පදනමක් මත අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වගන්ති 34 මඟින් සහතික කිරීමෙන් සහ ආබාධ සහිත පුද්ගලයන් හට පහසුවෙන් පිවිසීමේ හැකියාව පිළිබඳ සවිස්තරාත්මක ව වගන්තියක් ඉදිරිපත් කිරීම තුලින් මෙය සිදු කෙරේ.<br>සම අවස්ථා ලබා දීම පිළිබඳව ඇති සුවිශේෂ යෙදුම් මූලික අයිතිවාසිකම් සඳහා වූ පරිච්ඡේදයෙහි අදාළ වගන්ති වල අඩංගු කිරීම මඟින් ශ්‍රී ලංකාවේ දැනට පවතින ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ විශේෂ අවස්ථාවන්ට අනුකූල ආර්ථික, සාමාජීය, සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් සාක්ෂාත් කරගැනීම සඳහා සංකල්පමය සම්බන්ධතාවක් ගොඩනැඟිය යුතුය.<br>එම නිසා සමානාත්මතාවයෙන් සැළකීම යන සංකල්පය නොව ඉහත දැක්වූ සංකල්පය යොදාගෙන ආබාධ සහිත ජනතාවගේ අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම සඳහා නීතිමය රාමුවක් සැකසීම සිදු කළ යුතුය. | |
| මූලිකඅයිතිවාසිකම් | නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස හැඳින්වීමේ අයිතිය සහ ආබාධ සහිත පුද්ගලයෙකු ලෙස සෑම ආබාධ සහිත අයෙකුටම ස්වකීය ආවේණික සහ පෞද්ගලික ආත්මගරුත්වය, ස්වාධීනත්වය සහ පුද්ගලයෙකු ලෙස නිසි පිළිගැනීම හිමි විය යුතු අතර ඊට තමාගේම | රජය විසින් ආබාධ සහිත පුද්ගලයන්ගේ නිසි ආත්මගරුත්වය සහ ස්වාධීනත්වය මෙන්ම ඔවුන්ගේ තීරණ ගැනීමේ නිදහස හඳුනාගෙන ඊට ගරු කළ යුතුය.<br>ආබාධ සහිත පුද්ගලයන්ට සෑම අවස්ථාවකදීම නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස හැඳින්වීමේ අයිතිය හිමි විය යුතු අතර ජීවිතයේ සෑම අංශයකට ම අදාළව නීතිමය වලංගුභාවයක් |

| | | |
|---|---|---|
| | තීරණ ගැනීමේ නිදහස ද ඊට ඇතුළත් විය යුතුය.<br>මින් අර්ථ දැක්වෙන්නේ ආබාධ සහිත පුද්ගලයන් හට සෑම ශ්‍රී ලාංකීය පුරවැසියෙකුට මෙන්ම දේශපාලන හා සාමාජීය වශයෙන් මැතිවරණ ක්‍රමවේදය වැනි අවස්ථාවන් වලදී බලපෑම් ඇති කිරීමට ඔවුන් සතු අයිතිය ස්වකීය ආබාධ සහිත තත්ත්වය නිසා උල්ලංඝනය නොවිය යුතු බවය.<br>මීට අමතරව රජය විසින් එවැනි පුද්ගලයින්ගේ ශාරීරික හා මානසික ස්වීයභාවයට සහ ඔවුනට ඇති නීතිමය වලංගුභාවයට ගරු කිරීමේ යුතුකම ආදේශන ක්‍රියාවලියකට වඩා උපකාරක ක්‍රියාවලියක් මඟින් තීරණ ගැනීමේදී හඳුනාගත යුතුය. වර්ෂ 2014 අප්‍රේල් මස ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ කමිටුව විසින් නිකුත් කරන ලද ප්‍රකාශයක දැක්වෙන පරිදි 12 වන වගන්තිය මඟින් පැහැදිලිව ප්‍රකාශිත ආකාරයට ‘මානසික අයෝග්‍යතාවය සහ වෙනත් කොන් කිරීමට ලක් වන ආකාරයේ හැඳින්වීමේ වර්ගීකරණ ආබාධ සහිත පුද්ගලයන්ගේ නීතිමය හැකියාව (නීතිමය පිළිගැනීම සහ නීතිමය ආඥාදායකත්වය ප්‍රතික්ෂේප කිරීම සඳහා උපයෝගී නොකර ගත යුතු අතර එම වගන්තියෙහි ම සඳහන් පරිදි මානසික ශක්‍යතාවයෙහි සැබෑ අඩුපාඩු හෝ අනෙකෙකු විසින් දක්නා ආකාරයේ අඩුපාඩු එවැනි තැනැත්තන් සතු නීතිමය අයිතිය අවලංගු කිරීමට සාධාරණීකරනයක් ලෙස භාවිත නොකළ යුතුය.)<br>ඊට අමතරව කිසිදු ආකාරයක ආබාධ සහිත තත්ත්වයක් නිසා ඔවුන්ගේ නිදහස සීමා වීමට අවකාශ නොතැබිය යුතුය.<br>අවසාන වශයෙන් ආබාධ සහිත ජනතාවගේ ජීවත්වීමේ අයිතිය විශේෂයෙන් හඳුනාගත යුතු අතර ආබාධ සහිත පුද්ගලයන් වැඩි වශයෙන් අනතුරු වලට භාජනය | භුක්ති විඳීමේ හැකියාවක් පැවතිය යුතුය.<br>කිසිදු අවස්ථාවක “මානසික අයෝග්‍යතාවය කෙනෙකුගේ ඡන්දය ප්‍රකාශ කිරිමේ අයිතිය හෝ මැතිවරණයක් සඳහා අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීමේ අයිතිය උල්ලංඝණය කිරීමට යම්කිසි හෙයකින් හෝ භාවිතා නොකළ යුතුය.<br>ඔවුන්ගේ ස්වාධීන තීරණ ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය සඳහා රජය විසින් ආබාධ සහිත පුද්ගලයින්ගේ කැමැත්ත සහ අභිමතයට ගරු කරමින්  ඔවුනට නීතිමය හැකියාව භුක්ති විඳීම සඳහා අවශ්‍ය උපකාර ලබා ගැනීම සඳහා පහසුකම් සැළසිය යුතුය.<br>ආබාධ සහිත පුද්ගලයින්ගේ ජීවත්වීමේ අයිතිය, නිදහස සහ පුද්ගලික ආරක්ෂාව සෙසු පුරවැසියන් හා සමානව භුක්ති විඳිය යුතුය. රජය විසින් ආබාධ සහිත ජනතාවගේ ආරක්ෂාව සහ රැකවරණය සෑම ස්වාභාවික හෝ මිනිසා විසින් ඇතිකරන ලද ආපදා පිළිබඳ අවදානමක් ඇති අවස්ථාවකදී ම සහතික කළ යුතුය.<br>කිසිදු අවස්ථාවකදී ආබාධ සහිත තත්ත්වය හේතු කොට ගෙන කෙනෙකුගේ නිදහස සීමා කිරීම සිදු නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| | විය හැකි අවස්ථා වලට මුහුණදෙන පිරිසක් ලෙස මෙහිදී සැළකිල්ලට ලක්විය යුතුය. | |
| මූලිකඅයිතිවාසිකම් | අබාධ සහිත ජනතාව සඳහාම වෙන් වූ විශේෂ කොටසක් වෙන් කළ යුතු අතර එම කොටසෙහි ආබාධ සහිත භාවය පිළිබඳව විශේෂයෙන් සැළකිල්ලට ලක්වන වගන්ති අන්තර්ගත කළ යුතුය. එවැනි විශේෂ කොටසක් තුළ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳව වූ සම්මුතියෙහි දැක්වෙන ආබාධ සහිත භාවය පිළිබඳව නිර්වචන සඳහන් විය යුතුය. එහිදී ආබාධ සහිත බව පිළිබඳ සර්ව අන්තර්ග්‍රාහී, වෙනස්වීමට ලක්වන හා විවෘත වූ වැටහීමක් ගැබ්විය යුතුය. ඒ සමඟම ආබාධ සහිත බව හා දුබලතා යන සංකල්ප දෙකෙහි වෙනස්වීම මෙහි අන්තර්ගත විය යුතු අතර ආබාධ සහිත බව වටහා ගැනීමේදී අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස සැළකෙන පාරිසරික සාධාක විශේෂයෙන් සැළකිල්ලට ලක් කළ යුතුය.<br>එවැනි විශේෂ කොටසක් තුළ ආබාධ සහිත බවට සම්බන්ධ ව්‍යවස්ථාවේ වෙනත් තැනත සඳහන් නොවන මූලධර්ම අන්තර්ගත විය යුතුය. | ආබාධ සහිත පුද්ගලයන් ලෙස හැඳින්වෙන්නේ දීර්ඝ කාලීන ශාරීරික, මානසික, බුද්ධිමය හෝ සංවේදනමය දුර්වලතා හේතුවෙන් අන් අය හා සම මට්ටමකින් පූර්ණ හා ඵලදායී සමාජ සහභාගීත්වයකට බාධා පැමිණවීමේ තත්ත්වයකට පත් වූ පුද්ගලයන් වේ. ආබාධ සහිත පුද්ගලයන්ගේ වෙනස්කම් සඳහා නිසි ගෞරවය හා පිළිගැනීම හිමි විය යුතු අතර එය මානව විවිධත්වය හා මානුෂීයත්වයේ කොටසක් ලෙස හැඳින්විය යුතුය.<br>ජීවිතයේ සෑම පැතිකඩකට ම අදාළව සම අවස්ථා හිමි වන තත්ත්වයක් ආබාධ සහිත පුද්ගලයන් උදෙසා සහතික කිරීම සඳහා රජය විසින් එවැනි පුද්ගලයන් සඳහා ගොඩනැගිලි වෙත පිවිසීමේ පහසුකම්, ප්‍රවාහන පහසුකම්, තොරතුරු ලබා ගැනීමේ පහසුකම් සහ නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ වලට ලබා දෙන සෙසු සියලු පහසුකම් හා සේවා සමාන ආකාරයෙන් හිමි විය යුතුය. ඒ අනුව රජය මඟින් ක්‍රමානුකූලව සියලුම බාධා සහිත තත්ත්වයන් හඳුනාගෙන ඒ සඳහා නිසි පිළියම් යෙදීමට කටයුතු කළ යුතුය. |

4. යෝජිත ප්‍රතිපාදන

| | | |
|---|---|---|
| ස්වාධීන කොමිෂන් සභා මූලික අයිතිවාසිකම් | ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය : ආබාධ සහිත භාවයට අදාළ නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඉතිහාසයට අනුව සම්බන්ධීකරණයේ අඩුපාඩු, නිසි නිරීක්ෂණයක් නොමැති වීම, නිසි ලෙස ක්‍රියාත්මක නොවීම, විනිවිදභාවයක් නොමැති වීම සහ අධික දේශපාලනීකරණය හේතුවෙන් ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. රාජ්‍ය ආයතන මඟින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ගැටළු මානව හිමිකම් පිළිබඳ ගැටළු වශයෙන් හඳුනාගෙන නොමැත.<br>එබැවින් ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයේ දී උපරිම | ස්වාධීන කොමිෂන් සභා තුළ : ව්‍යවස්ථාදායක මණ්ඩලය මඟින් නිර්දේශ කරන ලද ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ...................... ක සාමාජික සංඛ්‍යාවකින් සැදුම්ලත් ආබාධ සහිත ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ කොමිසමක් පත් කළ යුතුය.<br>ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පනත තුළ :<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් මෙම පනතට අනුකූලව ආබාධ සහිත ජනතාවගේ සියලුම අයිතිවාසිකම් බලාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා විශේෂ උප කොමිසමක් පත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ස්වාධීනත්වය සහ සැළකිය යුතු බලතල සහිත ආයතනයක් පිහිටුවීම මඟින් ආබාධ සහිත බව පිළිබඳ ගැටළු වලට සම්බන්ධ ක්ෂේත්‍ර බොහෝමයක් ඇති බැවින් අමාත්‍යාංශ විශාල ප්‍රමාණයක් ආවරණය වන පරිදි කටයුතු සංවිධානය විය යුතුය. එමඟින් පැමිණිලි සළකා බැලීමට සහ ඒවාට අදාළ පරීක්ෂණ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට අදාළව සිදු කළ හැකි විය යුතුය.එය සමන්විත විය යුත්තේ ආබාධ සහිත භාවයට සම්බන්ධ විවිධ කේෂ්ත්‍ර වල පිළිගත් අත්දැකීම් හා ක්‍රියාකාරීත්වයක් සහිත සාමාජික පිරිසකගෙන් විය යුතු අතර විශේෂයෙන් ම එහිදී සියලුම ආබාධ සහිත තත්ත්වයන් ඇති පුද්ගලයින්ගේ නියෝජනයක් තිබීම වැදගත්ය. එහි ව්‍යුහය, බලතල හා ක්‍රියාකාරීත්වය මානව හිමිකම් හා සම්බන්ධ ආයතන වල ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල විය යුතු අතර (පැරිස් මුලධර්ම) ඒ පිළිබඳව ආබාධ සහිත ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 33 වගන්තියේ සඳහන්ව ඇත. මෙම ආයතන වර්ගය සඳහා ක්‍රමවේදයන් 2 ක් සැළකිල්ලට ගත හැක :<br>• ව්‍යවස්ථාදායක මණ්ඩලය මඟින් නිර්දේශිත සාමාජික පිරිසකගෙන් සැදුම් ලත් ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සඳහා වූ කොමිෂන් සභාව පිහිටුවීම.<br>• මානව හිමිකම් කොමිසමේ උප කොමිෂමක් වශයෙන් ප්‍රමාණවත් කොමසාරිස්වරු සහ කාර්ය මණ්ඩලයක් සහිතව පිහිටුවීම. | |
| මැතිවරණ වලට අදාළ ප්‍රතිසංස්කරණ | මැතිවරණ ක්‍රියාවලිය සඳහා සහභාගී වීම : | ව්‍යවස්ථා ප්‍රකාරව සුදුසුකම් ඇති සෑම වැඩිහිටි පුරවැසියෙකුට ම |

| | | |
|---|---|---|
| | ආබාධ සහිත පුද්ගලයන් සඳහා මධ්‍යම රජය මෙන්ම විමධ්‍යගත පාලන ව්‍යුහයන්හට අදාළ මැතිවරණ වලදී ඡන්දය ප්‍රකාශ කිරීමේ හා අපේක්ෂයන් ලෙස තරඟ වැදීමේ හිමිකම් සහ අවස්ථාවන් විශේෂයෙන් සඳහන් කළ යුතුය. දේශපාලන පක්ෂ වල නායකත්වය දැරීම සඳහා හෝ ඒ සඳහා තරඟ කිරීම සඳහා පුද්ගලයෙකුගේ ආබාධ තත්ත්වය නුසුදුසු කමක් ලෙස නොසැළකිය යුතුය.<br>ආබාධ සහිත පුරවැසියන් සඳහා මැතිවරණ වලට තරඟ කිරීමේ තත්ත්වයන් ඇති කිරීමේ යුතුකම විශේෂයෙන් සඳහන් කළ යුතුය. මෙහිදි එවැනි පුද්ගලයන් සඳහා මැතිවරණ වලට තරඟ කිරීමට අවශ්‍ය සහයෝගය වැඩිපුර ලබාදීම සඳහා දිරිමත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීම මඟින් ආබාධ සහිත පුද්ගලයන් වැඩි පිරිසකට මැතිවරණ සඳහා තරඟ කිරීමේ අවස්ථාව ලබා දිය යුතුය. දේශපාලන පක්ෂ වල අභ්‍යන්තර බල තුලනයන් ආබාධ සහිත පුද්ගලයන් හට වැඩි ප්‍රමුඛත්වයක් සහ සැළකිය යුතු බලපෑමක් එල්ල කිරීම සඳහා හැකියාවක් සැළසෙන පරිද්දෙන් වැඩි නායකත්ව නියෝජනයකට ඉඩ සැලසෙන අයුරින් වෙනස් කිරීමට උත්සාහ කළ යුතු අතර එමඟින් වැඩි වශයෙන් සැළසෙන මූල්‍යමය උපකාර වලට අදාළව වාසි ලබා ගැනීමට හැකි වන අයුරින් පක්ෂය තුළ පරිසරය සකස් කළ යුතුය. | • සෑම පරිපාලන ව්‍යුහයකට අදාළවම මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට ද එය රහස්‍ය භාවය ඇතිව සිදු කිරීමට ද<br>• මහජන නියෝජිතයෙකු ලෙස තරඟ කිරීමට ද, බලයට පත් වුවහොත් රාජකාරියෙහි නිරත වීමට ද<br>• දේශපාලන පක්ෂයක් පිහිටුවීමට සහ එහි ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට ද මධ්‍යගත හා විමධ්‍යගත දේශපාලන ව්‍යුහයන්හී අයිතිවාසිකම් හිමි විය යුතුය. යම් පුද්ගලයෙකුට ආබාධ සහිත තත්ත්වයක් පැවතීම හෝ පසුකාලීනව ආබාධ සහිත තත්ත්වයකට ලක් වීම එම පුද්ගලයා හට ඉහත අයිතිවාසිකම් භුක්ති විඳීමට කිසිසේත් ම අවහිරයක් නොවිය යුතුය. රජය විසින් ඡන්දය භාවිත කරන ක්‍රමවේදය තුළදී ආබාධ සහිත පුද්ගලයන් සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම්, තැපැල් ඡන්ද පහසුකම් හෝ ඊට සමාන වෙනත් ඡන්දය භාවිත කිරීමේ ක්‍රමවේද වලට අදාළ සියලු පහසුකම් සහ අදාළ ලිපි ලේඛන ලබා ගැනීමේ හැකියාව ඇති කිරීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවකදී ම කටයුතු කළ යුතුය. රජය මඟින් සුදුසුකම් ඇති ආබාධ සහිත පුද්ගලයින් සඳහා මැතිවරණ වලට තරඟ කිරීමට අවශ්‍ය තත්ත්වයන් සම්පාදනය කළ යුතු අතර ඊට අදාළව<br>  • ව්‍යවස්ථාදායක සභාවෙහි ආබාධ සහිත ජනතාව සඳහා වෙන් වූ විශේෂ ආසන වෙන් කිරීම සහ එහිදී ආබාධ සහිත පුද්ගලයන් නියෝජනය කරමින් අතිරේක ආසන සඳහා තරඟ කරන ආබාධ සහිත පුද්ගලයන් හට අසාධාරණයක් සිදු නොවන පරිදි එය සිදු කළ යුතුය.<br>  • දේශපාලන පක්ෂ සඳහා ආබාධ සහිත පුද්ගලයන් හට පහසුවෙන් නායකත්ව පදවීන් හිමිකර ගැනීමට හැකිවන පරිදි සුදුසුකම් සකස් කිරීම වෙනුවෙන් හා ලියාපදිංචි ගාස්තු සම්බන්ධයෙන් වෙනස්කම් ඇති කිරීමේ අරමුණෙන් එම |

| | | |
|---|---|---|
| | | පක්ෂ සඳහා දිරිමත් කිරීමේ ආධාර ලබා දීමට වැඩපිළිවෙළක් සැකසීම.<br>• සියලුම දේශපාලන පක්ෂ කාර්යාල ආබාධිත පුද්ගලයෙකුට අවශ්‍ය පිවිසුම් පහසුකම් සහිතව සකස් කර තිබීම.<br>• මැතිවරණ සඳහා තරඟ කරන ආබාධ සහිත පුද්ගලයන් හට සිය ආබාධ සහිත තත්ත්වය හේතුවෙන් ප්‍රචාරණ කටයුතු සඳහා වැය වන අමතර වියදම් වෙනුවෙන් මූල්‍යමය සහයක් ලබා දීමට අරමුදලක් පිහිටුවීම.<br>• ආබාධ සහිත අපේක්ෂකයින් සඳහා මාධ්‍ය ආවරණය ලබා දීම මඟින් ප්‍රචාරණය සඳහා සම අවස්ථා ලබා දීමේ අරමුණින් අදාළ පියවර ගැනීම.<br>• ආබාධ සහිත පුද්ගලයන් හට වඩා පහසුවෙන් මැතිවරණ වලට තරඟ කොට ආසන දිනා ගැනීමට හැකි වන ආකාරයෙන් ලබා ගත යුතු කඩඉම් ඡන්ද ප්‍රතිශතය අවම කිරීම. |
| ව්‍යවස්ථාදායකය | දේශපාලන ක්‍රියාකාරීත්වය සඳහා සහභාගීත්වය :<br>සමස්ත ව්‍යවස්ථා රාමුව තුළ ම නීති හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මහජන සහභාගීත්වයට ඉඩ සැලසිය යුතු අතර මේතාක් දුරට එම ක්‍රියාවලියේ දී වෙනස්කම් වලට භාජනය වී තිබූ ආබාධ සහිත ජන කොටස් වලට ද ඒ සඳහා දායකත්වය ලබා දීමේ හැකියාව ඇති කළ යුතුය. මින් අදහස් වන්නේ ආබාධ සහිත පුද්ගලයින් හට පාර්ලිමේන්තුවට කුමන පනත් ඉදිරිපත් වන්නේ ද යන්න පහසුවෙන් පරිශීලනය කළ හැකි ආකාරයෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාව තිබිය යුතු අතර 19 ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව නිර්දේශිත කාලයට වඩා වැඩි කාලයක් ඒ සඳහා හිමි විය යුතුය. | පාර්ලිමේන්තුව විසින්:<br>• ආබාධ සහිත ජනතාවගේ සහභාගීත්වය සහ ඔවුනට අවශ්‍ය අවස්ථා සහ පහසුකම් පිළිබඳ සැළකිලිමත් වෙමින් ව්‍යවස්ථාදායකයේ සහ වෙනත් ක්‍රියාවලි මෙන්ම ඊට අදාළ කමිටු වෙත මහජන දායකත්වය ලබා ගන්නා වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුය.<br>• පාර්ලිමේන්තු කටයුතු හා අදාළ කමිටු සම්බන්ධ කටයුතු පොදු ජනතාවට විවෘත වන පරිදි මෙහෙය විය යුතු අතර එහිදී සංඥා භාෂාව සහ බ්‍රේල් ක්‍රමය ඇසුරෙන් කෙරෙන සන්නිවේදනය අවශ්‍ය අවස්ථා වලදී යොදා ගත යුතුය.<br>• පනත් කෙටුම් පත් පිළිබඳ තොරතුරු ජනතාවගේ දැනගැනීම පිණිස බ්‍රේල් සහ සෙසු ක්‍රමවේදයන් මඟින් ආබාධ සහිත ජනතාවට පහසුවෙන් පරිශීලනය කළ හැකි වන පරිදි |

| | | |
|---|---|---|
| | මීට හේතුව වන්නේ ආබාධ සහිත පුද්ගලයන් වෙත අදාළ තොරතුරු විවිධ ලෙස සන්නිවේදනය වන බැවින් ඒ සඳහා ඔවුන්ගේ ප්‍රතිචාර ලබා ගැනීම සඳහා එක් ක්‍රමවේදයකින් පමණක් වැය වන කාලයට වඩා අධික කාලයක් වැය වන බැවිනි. පාර්ලිමේන්තුවේ ඉහල මන්ත්‍රී මණ්ඩලයක් පිහිටුවීම මගින් විවිධ ක්ෂේත්‍ර වල වෘත්තිකයින්ට හා ශ්‍රී ලංකාවේ බහුවාර්ගික සමාජයේ අඩුවෙන් නියෝජනය වන කණ්ඩායම් සඳහා ද නීති සම්පාදන ක්‍රියාවලිය සඳහා සහභාගී වීමට අවකාශ සැලසෙන බව සහතික කළ යුතුය. | පාර්ලිමේන්තුවට ඉදිරිපත් වීමට පෙර බෙදා හැරිය යුතුය.<br>• ව්‍යවස්ථා කෙටුම්පත් මහජන මත විමසුම් සඳහා විවෘතව තැබිය යුතු අතර ඒවා ආබාධ සහිත ජනතාවට පරිශීලනය කොට 1010ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය පරිදි සැකසීමටත් එම ප්‍රතිචාර ඔවුන් කැමති ක්‍රමවේදයකින් ලබා ගැනීමට හැකිවන පරිදි පහසුකම් සැළසීමටත් අවශ්‍ය කාලය ඒ සඳහා ලබා දිය යුතුය.<br>• ඉහළ මන්ත්‍රී මණ්ඩලයේ දී ආබාධ සහිත ජනතාව සඳහා විශේෂ ආසන ප්‍රමාණයක් වෙන් විය යුතු අතර එම ආසන ප්‍රමාණය නීතිමය වශයෙන් සම්මත විය යුතුය. |
| මූලික අයිතිවාසිකම් | පෞද්ගලිකත්වය : මූලික අයිතිවාසිකමක් ලෙස පෞද්ගලිකත්වය සඳහා වූ අයිතිය ආබාධ සහිත ජනතාව සඳහා වූ විශේෂ විධිවිධාන වලට අනුකූලව දැක්විය යුතුය. ආබාධ සහිත පුද්ගලයන්ගේ වෛද්‍ය වාර්තා,ලිපි ගනුදෙනු, මැතිවරණ හා සම්බන්ධ ලිපි ලේඛන ආදී වෙනත් පුද්ගලික ලිපි ලේඛන ගෘහස්ථ සහ පවුලට සම්බන්ධ වෙනත් පාර්ශව වල බලපෑම් වලට නතු නොවන පරිදි සුරක්ෂිතව තබා ගත හැකි විය යුතුය. | සෑම දෙනාට ම පෞද්ගලිකත්වය සඳහා අයිතිවාසිකමක් ඇත. එබැවින් කිසිවෙකුගේ පුද්ගලික, ගෘහස්ථ, පවුල හා සම්බන්ධ, දේපළ හා සම්බන්ධ, ලිපි ගනුදෙනු හා සම්බන්ධ මෙන්ම වෙනත් ආකාර වල පුද්ගලික පණිවුඩ ආදිය නීත්‍යානුකූල නොවන බලපෑම් වලට ලක් නොවිය යුතුය. රජය විසින් ආබාධ සහිත ජනතාවගේ පුද්ගලිකත්වය පිළිබඳ අයිතිය අන් අය හා සමානවම ආරක්ෂා කිරීමට බැඳී සිටින අතර එහිදී ඔවුන්ගේ පුද්ගලික සෞඛ්‍යමය, පුනරුත්ථාපන හා ඡන්දය ප්‍රකාශ කිරීමට අදාළ තොරතුරු වැනි දෑ සැලකිල්ලට ගැනේ. |
| මූලික අයිතිවාසිකම් | සූරාකෑමට ලක් වීමෙන් නිදහස : ශ්‍රී ලංකාවේ මේ වන විට ඉතා අධික වශයෙන් ආබාධ සහිත පුද්ගලයන් ආයතනීකරණයට ලක් වෙමින් පවතී. විශේෂයෙන් කාන්තාවන් හා ගැහැණු දරුවන් සූරාකෑම් වලට ලක්වීමේ අවධානම ඉතා ඉහළ මට්ටමක පවතී. | රජය විසින් ආබාධ සහිත පුද්ගලයන් සඳහා සියලු ආකාරයේ සූරා කෑම් හා අපචාර වලින් ආරක්ෂා කළ යුතු අතර මේ සම්බන්ධව ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධ කාරණා ගෘහස්ථ හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශයේ ආයතන පසුබිම් වලදී විශේෂ අවධානයට ලක් කළ යුතුය. |
| මූලික අයිතිවාසිකම් අධිකරණ ව්‍යුහය | නීතිය හා සාධාරණය පහසුවෙන් උදාකර ගත හැකි වීම : ආබාධ සහිත පුද්ගලයන් සඳහා පොලීසියේ ආධාර පැතීමට සාධාරණ අවස්ථා සළසා දිය යුතු අතර එහිදී අපරාධයක් වාර්තා කිරීම, අධිකරණය වෙත නඩු කැඳවීම, සාක්ෂිකරුවෙකු ලෙස ඉදිරිපත් වීම වැනි කිසියම් හෝ ආකාරයක නීතිමය ක්‍රියාවලියේ | රජය විසින් ආබාධ සහිත ජනතාවට නීති පද්ධතිය වෙත යොමු වීම සඳහා ඔවුන්ගේ වයස සහ ජොෂ්ඨත්වයට අනුව අදාළ පහසුකම් සහ සෙසු සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලනු ලැබිය යුතු අතර එමගින් ඔවුනට නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ විශේෂ අධිකරණ ඇතුළු සියලු අධිකරණ පද්ධතීන් වෙත යොමු වී අපරාධයක් වාර්තා කිරීමට, සාක්ෂිකරුවෙකු ලෙස පෙනී සිටීමට හෝ වෙනයම් නීතිමය කටයුත්තකට සහභාගීවීමට |

| | | |
|---|---|---|
| | දායකත්වයන් දැක්වීම සැළකිය හැක.<br>මානසික හා බුද්ධිමය ආබාධ සහිත පුද්ගලයන් හටද ආබාධ සහිත කුඩා දරුවන් හට නීතියේ සහය පැතීමට විශේෂ ක්‍රමවේදයක් සැකසිය යුතුය. මීට අමතරව මූලික අයිතිවාසිකම් පිළිබඳ අයදුම්පත් ප්‍රාදේශීය මට්ටමින් ඊට සුදුසු අධිකරණයක් තුළදී විභාග කිරීමට අවකාශ සැලසීම මඟින් ජනතාව වෙත අධිකරණය වඩාත් සමීප කිරීමට ක්‍රියාකළ යුතුය. මෙයට සංක්‍රාන්තීමය යුක්තිය පසිඳලීම සඳහා විශේෂයෙන් පිහිටුවන ලද අධිකරණ අයත් වේ.<br>නීතියේ ආධිපත්‍ය සුරැකීමේ කාර්යයට අමතරව මෙමඟින් ආබාධ සහිත පුද්ගලයන් හට අධිකරණ පද්ධතිය වෙත යොමුවීම සඳහා වඩාත් හොඳින් අවස්ථාව සැලසේ. මෙහිදී සැළකිය යුතු කාරණය වන්නේ ආබාධ සහිත පුද්ගලයන් බොහෝමයක් කොළඹින් පිටත වාසය කරන බැවින් ප්‍රවාහන කටයුතු සඳහා ඔවුනට අධික දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වීමයි. | නීතියේ සෑම අංශයකදී ම හැකියාව තිබිය යුතුය.<br>කිසිදු අවස්ථාවක ආබාධ සහිත තත්ත්වයක් නිසා පුද්ගලයෙකුට නීතියේ පිහිට පැතීම සඳහා ඇති අයිතිය උල්ලංඝණය වීමට අවකාශ නොතිබිය යුතුය.<br>ඕනෑම අයෙකුට පළාත් අධිකරණයක් හෝ වෙනත් පිළිගත් අධිකරණයක් මඟින් තමාට සිදුවී ඇති අයිතිවාසිතම් උල්ලංඝණය වීම පිළිබඳ කටයුතු කළ හැකි අතර එවන් අවස්ථාවකදී  අධිකරණය විසින් සුදුසු සහනයක් හෝ අදාළ අයිතීන් පිළිබඳ ප්‍රකාශයක් ලබා දිය යුතුය.<br>අධිකරණ පද්ධතිය සඳහා යොමුවිය හැකි පුද්ගලයින්:<br>• තමන් වෙනුවෙන් පෙනී සිටින තැනැත්තන්<br>• තමන්ගේ නමින් පෙනී සිටීමට නොහැකි අයවලුන් වෙනුවෙන් පෙනී සිටින තැනැත්තන්<br>• ආබාධ සහිත පුද්ගලයින් විසින් ඉල්ලීමක් සිදු කරන ලදුව ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින තැනැත්තන්<br>• යම් ජන කණ්ඩායමක් වෙනුවෙන් එහි සාමාජිකයෙකු හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින හෝ තැනැත්තන්<br>• පොදු අරමුණක් උදෙසා ක්‍රියාකරන තැනැත්තන්<br>• තම සාමාජිකත්වය වෙනුවෙන් පෙනී සිටින සංවිධාන |
| මූලික අයිතිවාසිකම් රාජ්‍ය සේවා | ආර්ථික හා සාමාජීය අයිතිවාසිකම් : ආබාධ සහිත ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය තුළ ඉතා විස්තරාත්මකව මෙම අයිතිවාසිකම් පිළිබඳව ආබාධ සහිත පුද්ගලයින්ට අදාළව ඉදිරිපත් කෙරෙන අතර මෙහිදී ආබාධ සහිත තත්ත්වය හා දුරිද්‍රතාවය අතර ඇති සබඳතාව සහ  එම සාධක දෙක මඟින් ඒවා තහවුරු වන ආකාරය ඉදිරිපත් කෙරේ. අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ සුරක්ෂිතභාවය සහ නිවාස පිළිබඳ මෙන්ම වෙනත් අයිතිවාසිකම් වලට සම්බන්ධව ශ්‍රී ලංකාව අපරානුමත කර ඇති ගිවිසුම් ප්‍රකාරව ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳව වැඩි සැලකිල්ලක් දැක්විය යුතුය. | ආබාධ සහිත පුද්ගලයින්සමානා්‍ය අධ්‍යාපන ක්‍රමවේද තුළදී ආබාධ සහිත තත්ත්වය මත පදනම් වූ වෙනස්කමකට ලක් නොවිය යුතුය. එවැනි පුද්ගලයින් සඳහා විශේෂ සහයක් අධ්‍යාපනය ක්‍රමය තුළදී ලබා දීමට රජය සහතික විය යුතුය.  ඒ ආකාරයෙන් ඔවුන්ගේ අධ්‍යාපනික හා සාමාජීය සංවර්ධනය වැඩිදියුණු කිරීමට අවශ්‍ය බ්‍රේල් හා සංඥා භාෂා ගුරුවරුන් පුහුණු කළ යුතුය.<br>සෙසු සියලු දෙනාටම නොමිලේ ලබා දෙන සෞඛ්‍ය පහසුකම් ආබාධ සහිත පුද්ගලයන්ට ද ස්වකීය ආබාධ තත්ත්වයන් හේතුවෙන් හිමිවිය යුතු අතර ඔවුන්ගේ ආබාධ තත්ත්වයට අනුව පුනරුත්ථාපන පහසුකම් ද ලබා දීමට රජය විසින් ඔවුන්ගේ කැමැත්ත මත කටයුතු කිරීම අවශ්‍ය වේ.<br>ආබාධ සහිත තත්ත්වය මත පදනම්ව කිසියම් හෝ වෙනස්කමක් රැකියා වලට බඳවා ගැනීම හා සම්බන්ධ  සියලු අවස්ථා වලදී ද රැකියාවේ අඛණ්ඩව ම නිරත වීමේදී හා රැකියාවෙන් |

| | | |
|---|---|---|
| | | ඉහළට යෑමේදී මෙන්ම රැකියාවේ පරිසර තත්ත්වයන්ට අනුගතව සිදු කිරීම තහනම්ය. පරිපාලන සේවය සඳහා ද යම් කාර්තුවකට අනුව ආබාධ සහිත පුද්ගලයින් බඳවා ගැනීම සඳහා නීති සම්පාදනය කළ යුතුය. එහිදී සාධාරණ පහසුකම් සැපයීමට ද රජය විසින් වග බලා ගත යුතුය. |
| මූලික අයිතිවාසිකම් | තොරතුරු ලබා ගැනීමේ හැකියාව : තොරතුරු ලබා ගැනීමේ අයිතිවාසිකම නව ව්‍යවස්ථාවේ අන්තර්ගත විය යුතු අතර විශේෂයෙන්ම එය ආබාධ සහිත ජනතාව සඳහා ද වලංගු විය යුතුය. මක්නිසාද යත් එය ඔවුන්ගේ ප්‍රකාශන නිදහසට හා තොරතුරු ලබා ගැනීමේ නිදහසට ඉතා වැදගත් වන බව ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ සඳහන් වන බැවිනි. ආබාධ සහිත ජනතාව තොරතුරු ලබා ගැනීමේ දී බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙන අතර ඒවා පොදු ජනතාව සඳහා විවෘතව පැවතියත් ඔවුනට ඒවා ලබා ගත හැකි මට්ටමක නොපවතින නිසා එය ඔවුන්ට දුෂ්කර වී ඇත.<br>ආබාධ සහිත පුද්ගලයින්ට මැතිවරණ ක්‍රියාවලියට සහභාගී වීමේදී අභියෝගයක් ලෙස හඳුනාගත හැක්කේ ඔවුනට නිසි කාලයට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා සෙසු අයට සාපේක්ෂව සමාන හැකියාවක් නොමැති බැවිනි. එබැවින් ඔවුනට දේශපාලන නියෝජිතයන්ගේ සුදුසුකම් සහ විශේෂතා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට නොහැකි වේ. ආබාධිත සහිත ජනතාවට අවශ්‍ය විවිධ සේවාවන් වන සමාජ සුභ සාධන ගෙවීම්, පිවිසුම් රෙගුලාසි, වෛද්‍ය වාර්තා සහ අධ්‍යාපනික තොරතුරු වැනි විස්තර ලබා ගත හැකි ආයතන නිසි විනිවිදභාවයක්, ආබාධ සහිත පුද්ගලයන් සඳහා නොදක්වන්නේ නම් ආබාධ සහිත පුද්ගලයන්ට එම ආයතන පිළිබඳ විශ්වාසය තැබිය නොහැක. | සෑම පුරවැසියෙකුටම රජයේ ආයතනයක් සතු තොරතුරු ලබා ගැනීමේ හැකියාව තිබිය යුතුය.රජය විසින් ආබාධ සහිත පුද්ගලයින් සඳහාද මෙම තොරතුරු ඉල්ලුම් කිරීම මඟින් ලබාගත හැකි ආකාරයට පහසුවෙන් පරිශීලනය කළ හැකි ක්‍රමවේදයන් මඟින් සියලුම ආබාධ සහිත පුද්ගලයන්ට නිසි කලට අමතර වියදමක් රහිතව නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. ආබාධ සහිත ජනතාවට එවැනි තොරතුරු ඉල්ලුම් කිරීමටත් ඔවුන්ට අභිමත ක්‍රමවේදයකින් ලබා ගැනීමට හිමිකමක් තිබිය යුතුය. |

| | | |
|---|---|---|
| | මෙම තොරතුරු ලබා ගැනීමේ නොහැකියාව ආබාධ සහිත පුද්ගලයන්ගේ දේශපාලනික, ආර්ථික, සාමාජීය අයිතිවාසිකම් රාශියක් භුක්ති විදීම කෙරෙහි බලපෑම් ඇති කරන බැවින් අදාළ තොරතුරු ආබාධ සහිත පුද්ගලයින් හට පහසුවෙන් ලබා ගත හැකි ආකාරයට නිකුත් කිරීමට ව්‍යවස්ථාවෙහි තොරතුරු පිළිබඳ පනතෙහි විධිවිධාන සැකසිය යුතුය. | |